# කොළඹ දිසා අධිකරණයේ දී ය.

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 100 වන වගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමක් පිළිබඳව වූ කාරණයක් සම්බන්ධයෙනි.

කොළඹ 10. ශ්‍රී විපුලසේන මාවතේ
අංක 107/4 දරණ ස්ථානයේ
නිහාල් ශ්‍රී අමරසේකර

පැමිණිලිකරු

නඩු අංකය : 21810/එම්. ආර්.

- එරෙහිව -

1. කොළඹ 2 ස්ටේපල්ස් වීදියේ පිහිටි
"විදුම්පාය" යන ස්ථානයේ සහ
කොළඹ 5 කිරුළ පෙදෙසේ
අංක 37 දරණ ස්ථානයේ
ගාමිණී ලක්ෂමන් පීරිස්.

2. හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ
කොළඹ හිල්ටන් ක්‍රීඩා සංකීර්ණය බාරේ
එව්ලන් චතුරශ්‍රය, ලෝටස් පාර
කොළඹ 1.

විත්තිකරුවන්

1999ක් වූ ජුනි මස 02 වන දින දිය.

ස්වකීය නීතිඥ, ද සිල්වා සහ පෙරේරා හා මය සහ විලා ගය යටතේ නීති වෘත්තියේ යෙදී සිටින ජේ. ඩබ්ලිව්.ඩී. පෙරේරා මගින් පෙනී සිටිනු ලබන පැමිණිලිකරුගේ පෙත්සමෙහි පහත සඳහන් අයුරු ප්‍රකාශ කෙරේ.

1. 2 වැනි විත්තිකාර සමාගම විචාරීම සඳහා විචාරණ, එහි සභාපති ඩී.වයි. ලියනගේ මාර්ගයෙන් අධිකරණය මගින් බාර කරවීමට, සිවිල් නඩු විධාන සංග්‍රහයේ (97වන වගන්තිය සමග කියවෙන) 94 වන වගන්තිය යටතේ ඉල්ලීමක්, පැමිණිලිකරු විසින් 1999.05.03 වන දින කරන ලදී.

2. අධිකරණය සෑහීමට පත්වන ලදුව, එම විචාරණ, 2 වන විත්තිකාර සමාගමේ එකී සභාපති වෙත බාර කරවන ලෙසට, 1999.05.05 වන දින අධිකරණය නියෝග කළේය.

3. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 99 වන වගන්තිය ඉටු නොකරමින්, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 98 වන වගන්තියට අනුකූලතාවයකින් යුතු නොවන, විරෝධතා 2වන විත්තිකාර සමාගමේ එකී සභාපති විසින් 1999.05.31 වන දින ඉදිරිපත් කරන ලදී.

4. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 98 වන වගන්තිය ප්‍රකාර, කිසිදු හෝ නිශ්චිත හේතු හේතු දැක්වීමක් මත, කිසියම් නිශ්චිත විචාරණයකට පිළිතුරු දීමට 2වන විත්තිකාර සමාගමේ එකී සභාපති නියත වශයෙන් විරුද්ධවී නොමැත.

5. මේ අනුව, 2වන විත්තිකාර සමාගමේ එකී සභාපති විසින් කිසියම් නිශ්චිත විචාරණයකට පිළිතුරු දියයුතු නොවන්නේද යන්න නිශ්චය කරනු පිණිස අධිකරණය අභියස හරවත් හේතු සාධක තබා නොමැති බැවින්, 2වන විත්තිකාර සමාගමේ එකී සභාපති විසින් අභිමුඛ පරීක්ෂණයක් හෝ දිවුරුම් ප්‍රකාශයක් මගින් සියළුම විචාරණයන්ට පිළිතුරු දියයුතු බවට නියම කෙරෙන නියෝගයක් සිවිල් නඩු විධාන සංග්‍රහයේ 100 වන වගන්තිය වෙතේ පැමිණිලිකරුගේ වාසියට ලබා ගැනීමට පැමිණිලිකරුට හිමිකම් ඇති බව, පැමිණිලිකරු ගෞරව පූර්වකව ප්‍රකාශ කර සිටී.

එබැවින් පැමිණිලිකරු අයැද සිටිනු ලබන්නේ ගෞරවණීය ඔබ තුමාගේ අධිකරණය විසින් කාරුණිකව :

අ) 2වන විත්තිකාර සමාගමේ එකී සභාපති වෙත නොතීසියක් නිකුත් කරන ලෙසත්,

ආ) 2වන විත්තිකාර සමාගමේ එකී සභාපතිගේ විරෝධතා ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන ලෙසත්,

ඇ) 2වන විත්තිකාර සමාගමේ එකී සභාපති විසින්, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 100 වන වගන්තිය ප්‍රකාර අභිමුඛ පරීක්ෂණයක් හෝ දිවුරුම් ප්‍රකාශයක් මගින් එම විචාරණයන්ට පිළිතුරු දිය යුතු බවට නියම කෙරෙන නියෝගයක් කරන ලෙසත්,

ඈ) නඩු ගාස්තු සහ

ඉ) අධිකරණයට උචිත යයි හැඟෙන වෙනත් එවැනි සහ වැඩිදුර සහනයන් ප්‍රදානය කරන ලෙසත්ය.

(signature)

පැමිණිලිකරුගේ නීතිඥ